රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/2/5-3 වෙළුම II

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதි / Date: 2025.06.18

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,

**<u>ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම</u>**

දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම කාලීන අවශ්‍යතාවක් බව නිරීක්ෂණය වූ බැවින් 2024.12.31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් යාවත්කාලීන කරන ලද පුරප්පාඩු ලේඛනය අනුව පැවති පුරප්පාඩු 1881න් 2024.06.10 දින සිට ලබා දෙන ලද පුහුණු පත්වීම් අතරින් පුහුණුව භාර නොගැනීමෙන් හා පුහුණුව අතරතුර පුහුණුව හැරයාමෙන් ඇතිවූ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව පුහුණුලාභීන් 223ක් බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පවතින තනතුරු පුරප්පාඩු 1658 ක් සම්පූර්ණ කිරීම සඳහා නිර්දේශ **රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුවේ** අනුමැතියට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලදී.

02. ඒ සඳහා 2025.05.26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව බඳවා ගැනීමේ විභාගයට අදාළව ගැසට් නිවේදනය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

03. බඳවා ගැනීමේ ක්‍රියාවලිය ඉදිරි මාස කිහිපය තුළ ක්‍රියාත්මක කිරීමෙන් පසු සුදුසුකම්ලාභීන් ආයතනික පුහුණුව සඳහා 2025 දෙසැම්බර් මස වන විට බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

04. ඒ අනුව 2026 වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව තත්‍ය (Actual) කාර්ය මණ්ඩලයට ඇතුළත් කර වැටුප් සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. තවද, මෙහිදී බඳවා ගැනීමට අපේක්ෂිත දිස්ත්‍රික් මට්ටමේ පුරප්පාඩු ප්‍රමාණය ඇතුළත් ලේඛනය ඇමුණුම 01 මගින් ඉදිරිපත් කරමි.

(signature)

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය : 011- 2050372
ෆැක්ස් : 011- 2369842
විද්‍යුත් ලිපිනය : gnaddivision@gmail.com

## ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම - 2025

| අනු අංකය | දිස්ත්‍රික්කය | ග්‍රා.නි. තනතුරු පුරප්පාඩු පිරවීම 2025 |
|---|---|---|
| 1 | කොළඹ | 76 |
| 2 | ගම්පහ | 177 |
| 3 | කළුතර | 103 |
| 4 | මහනුවර | 124 |
| 5 | මාතලේ | 67 |
| 6 | නුවරඑළිය | 50 |
| 7 | ගාල්ල | 107 |
| 8 | මාතර | 67 |
| 9 | හම්බන්තොට | 77 |
| 10 | යාපනය | 60 |
| 11 | මන්නාරම | 16 |
| 12 | වවුනියාව | 25 |
| 13 | මුලතිව් | 17 |
| 14 | කිලිනොච්චි | 6 |
| 15 | මඩකලපුව | 31 |
| 16 | අම්පාර | 39 |
| 17 | ත්‍රිකුණාමලය | 29 |
| 18 | කුරුණෑගල | 182 |
| 19 | පුත්තලම | 89 |
| 20 | අනුරාධපුරය | 88 |
| 21 | පොළොන්නරුව | 37 |
| 22 | බදුල්ල | 64 |
| 23 | මොනරාගල | 25 |
| 24 | රත්නපුර | 49 |
| 25 | කෑගල්ල | 53 |
| **Total** | | 1658 |